කොන්දේසි

සදාකාලික උරුමය

නේෂන්ස් ට්‍රස්ට් බැංකුව

Private Banking

අන්තර්ගතය


1. ධනඋත්පාදනය
    1.1 සම්බන්ධතා කළමනාකරණය හා ප්‍රමුඛතා සේවය
    1.2 පුද්ගල අවශ්‍යතා අනුව සැකසූ මූල්‍යඋපායමාර්ගසහිත ධන හවුල්කාර විසඳුම්
    1.3 වත්කම් සැලසුම් සේවා
    1.4 කලා උපදේශක සේවා
    1.5 බැංකු සේවානිවසටම
    1.6 විශේෂිත ණය කාඩ්පත්, ණය හා අයිරා පහසුකම්
    1.7 අයෝජන හා තැන්පතු ගිණුම්
    1.8 ගෙවීම් හා මුදල් කළමනාකරණ සේවා
    1.9 බහුවිධමාර්ගඔස්සේප්‍රවේශවීමේහැකියාව
2. ජීවන රටාව
    2.1 සංචාරක චාරිකා වරප්‍රසාද
    2.2 ගුවන්තොටුපලවිවේකාගාර පහසුකම්
    2.3 ජීවනරටාවටගැලපෙනප්‍රවේශ/ පහසුකම්
    2.4 පුද්ගලඅවශ්‍යතාඅනුවසකස්කළවැඩසටහන්හාවෙළඳපළඅපේක්ෂාවන්පිළිබඳසම්මන්ත්‍රණ
3. උරුමය
    3.1 පරාර්ථකාමීකළමනාකරණගිණුම්සේවය
    3.2 කණිෂ්ඨ Private Banking සේවය
    3.3 අනාගත නායක වැඩසටහන
4. Private Banking - ගෝලීය සමාජිකත්වය
5. ප්‍රතිලාභ ලුහුඬින්
6. සුදුසුකම් ලැබීමට සපුරාලිය යුතු සුදුසුකම්
7. සම්බන්ධතා සමාලෝචනය
8. කොන්දේසි
9. බැංකුව හා සම්බන්ධ වීම

**සුවිශේෂී බැංකුකරණය**

ඔබගේ සියලුම මූල්‍ය අවශ්‍යතා කළමනාකරණයසහප්‍රමුඛතාසේවාසපයන්නෙකුලෙසනේෂන්ස් ට්‍රස්ට් බැංකුවේ Private Banking සුවිශේෂී සාමාජිකත්වයට අපි ඔබව සාදරයෙන් පිළිගන්නෙමු. ඔබගේ අද්විතීය ජීවන රටාව සහ මූල්‍ය අවශ්‍යතා වෙනුවෙන් පරිපූර්ණ සේවාවක් ලබා දීමට මෙම ක්ෂේත්‍රය පිළිබඳ අප සතු දැනුම සහ නිපුණතාව මහත්පිටුවහලක්වි ඇත. ඔබට වැදගත් වන ඔබගේ සම්පතයන්, වෘත්තිය, ආශාවන්, නිවස සහ ඒ සියල්ලටම වඩා වැදගත් වන ඔබගේ උරුමය ඇතුළත් වන ඔබේ ජීවිතයේ සෑම අංශයක්ම කාර්යක්ෂමව සපුරාලීමට අප සතු අත්දැකීම් ඉවහල් වනු ඇත. දිනෙන් දින වෙනස් වන ආර්ථිකයක් තුළ, ඔබගේ මූල්‍ය සාර්ථකත්වය සහ ඊට ගැළපෙන ජීවන රටාව අතර කදිම සංකලනයක් ඇති කර ගැනීමට අපගේ සහයෝගය නිරන්තරයෙන් ලබාදීමට අපි කැප වී සිටින්නෙමු. මෙම අංශ පිළිබඳ සැලකිළිමත් වෙමින්, විශිෂ්ටත්වය වෙනුවෙන්ම කැප වූ මූල්‍ය විසඳුමක් මෙන්ම ඔබගේ ජීවන රටාවේ මූල්‍ය අවශ්‍යතා තෘප්තිමත් කිරීම වෙනුවෙන් සකස් කළ නේෂන්ස් ට්‍රස්ට් Private Banking සාමාජිකත්වය සමඟින් අපගේ බැංකුකරණ අත්දැකීම ඔබ කේන්ද්‍ර කර ගනිමින් සන්නද්ධවිඇත.

'ධනඋත්පාදනය, ජීවන රටාව හා උරුමය' යන කුළුණු ත්‍රිත්වය මතඉදිකරඇතිඅසමසම නිෂ්පාදන හා සේවාවන් මාලාවක් ඔබගේ සුවිශේෂී දෛනික අවශ්‍යතා සපුරාලීම වෙනුවෙන් අපි පිරිනමන්නෙමු. සෑම නිෂ්පාදනයක් හා සේවාවක් මඟින්ම ඔබට නොයෙක් ප්‍රතිලාභ හිමි කර දෙන අතර ඔබගේ 'සදාකාලික උරුමය' ගොඩ නැගීමේ කාර්යය වෙනුවෙන් ඔබට අනගිඅවස්ථාවක්දලබාදීඇත.

Private Banking සාමාජිකත්වයලැබූඔබටඅපේ සුබ පැතුම්!

## 1. ධනඋත්පාදනය

### 1.1 සම්බන්ධතා කළමනාකරණය හා ප්‍රමුඛතා සේවය

ඔබවෙනුවෙන්මකැපවූසබඳතාකළමණාකරුබැංකුවේනියෝජිතවරයාලෙසක්‍රියාකරනඅතරඔබගේසියලුම්බැංකුස හමුල්යඅවශ්යතාඔහුවිසින්ඉටුකරනුඇත. ඔහු ඔබගේ මූල්‍ය අනාගතය වඩා හොඳින් සැලසුම් කිරීමටත් සුරක්ෂිත කිරීමටත් ඔබට කාලීන වශයෙන් වැදගත් තොරතුරු ලබා දෙනු ඇත.ඔබගේ සබඳතා කළමනාකරු නිරන්තරව ඔබ සමග සම්බන්ධ වෙමින් ඔබට අවශ්‍යඋපකාර කරනු ඇත. අපගේ ගනුදෙනුකරුවන් ආයෝජනයක් ලෙස අප සළකන අතර ඔබට වඩා හොඳ සේවයක් සැලසීමේ අරමුණින් අමතර අවශ්‍යතාවයන්ඉටුකරලීමටඅපි කිසිසේත් මැළි නොවෙමු. ඔබට සමීපතමබැංකු ශාඛාවේදී හෝ අපගේ විශේෂිත Private Banking මධ්‍යස්ථානවලදී ඔබගේ සබඳතා කළමනාකරු හමුවීමේ හැකියාව ඇත.

වැදගත්මකරුණවනුයේ, ඔබ Private Banking සාමාජිකයෙකු වශයෙන් අප බැංකුවේ ප්‍රමුඛ ගනුදෙනුකරුවෙකු ලෙස හඳුනා ගෙන, ඔබට ලැබිය යුතු විශේෂ සත්කාරයහාඅවධානය එසැණින් ලබා දීමට අප කටයුතු කිරීමයි. ඔබට සේවාලබා දීම වෙනුවෙන්ම අපගේ ප්‍රධාන බැංකු ශාඛාවල විශේෂ කවුන්ටර හා සේවා පරිශ්‍රයන් වෙන් කර ඇත.

## 1.2 පුද්ගල අවශ්‍යතා අනුව සැකසූ මූල්‍ය උපක්‍රම සහිත ධන හවුල්කාර විසඳුම්[1]

අපගේ ධන හවුල්කාර විසඳුම්සේවාව මගින් විවිධාංගීකරණය වූ මූල්‍ය කළඹක් (Portfolio) පහසුවෙන් ලබා ගත හැකිය. ඔබටම සුවිශේෂී වූ අවශ්‍යතා හඳුනා ගැනීමට ඔබගේ සේවය වෙනුවෙන්ම කැපවූ සබඳතා කළමණාකරු ඔබට උපදෙස් ලබා දෙනු ඇත. පසුව, ඔබගේ අරමුණු සඳහා වූ මූල්‍ය උපක්‍රම භාවිතා කරමින් ඔබගේ අවශ්‍යතාවයන්ටම ගැළපෙන පරිදි සකස් කරන ලද නිෂ්පාදන හා සේවා ඔස්සේ කදිම මූල්‍ය විසඳුම් ලබා දීමට ඔවුහු කටයුතු කරති.

- ඔබටදැරීමටහැකිඅවදානම්තත්ත්වයතක්සේරුකිරීමසඳහා ඔබට ප්‍රශ්නාවලියක් ලබා දෙන අතර ඒ අනුව සබඳතා කළමනාකරු විසින් ඔබට ගැළපෙන මූල්‍ය විසඳුම් යෝජනා කරනු ඇත.
- අපගේකැපවූ'ධන හවුල්කාර සේවය'(Nations Wealth PartneringService)සඳහා අත්සන් කළ පසු ඔබ වෙනුවෙන් කැපවූ භාණ්ඩාගාර විශේෂඥ කණ්ඩායම විසින් පුළුල් පරාසයකින් යුත් ප්‍රාග්ධන වෙළඳපල විශේෂඥයින්ගෙන් සමන්විත සුවිශේෂී රැස්වීම් සහ සාකච්ඡා සංවිධානය කරනු ලබන අතර ඒ තුළින් ලැබිය හැකි හොඳම විසඳුම් ලබා ගැනීමට ඔබට අවස්ථාව හිමි වේ[1].
- නිරන්තරයෙන් ඔබව පියවරක් ඉදිරියෙන් තැබීමේ අරමුණින්කාලීන තක්සේරු වාර්තා සහ කල්පිරීම්, මූල්‍ය සැලසුම්, දිගු/පැවරීම් වැනි ප්‍රධාන සන්ධිස්ථාන මෙන්ම අනෙකුත් වැදගත් සන්ධිස්ථාන පිළිබඳ කල්තියා ඔබට දැනුම්දීමට කටයුතු කරනු ඇත[1].
- තෙවනපාර්ශවීයසේවාසපයන්නන්සමග ඔබට ඇති සියලුම සබඳතා ඔබ වෙනුවෙන් කැපවූ සේවා කණ්ඩායම විසින් සම්බන්ධීකරණය කරනු ලබන අතර ඔවුන් ආයෝජන අවස්ථා සහ මතුවන වෙළඳපල ප්‍රවණතා පිළිබඳව ඔබවනිරන්තරයෙන්දැනුවත්කිරීමටකටයුතු කරනු ඇත. ඒ තුළින් සැමවිටම දැනුවත් හා කාලීන ආයෝජන තීරණ ගැනීමට ඔබට හැකිවනු ඇත[1].

*[1]ධන හවුල්කාර සේවයහා එහරහා පිරිනමනු ලබන නිෂ්පාදන සහ සේවාවන්, කොන්දේසි වලට යටත් වන අතර වැඩි විස්තර සඳහා ඔබගේ සබඳතා කළමනාකරු අමතන්න.*

### 1.2.1 නේෂන්ස් ට්‍රස්ට් බැංකුවේ Private Banking සාමාජිකයින් සඳහා වූ සුවිශේෂී වරණීය අනුපාත සහ ගාස්තු පහත සඳහන් වේ[2]:

- ස්ථාවර තැන්පතු සඳහා වරණීය පොළී අනුපාත[2]
- විශේෂ තීරු බදු හා ගාස්තුවලින් නිදහස් කිරීම්[2]
- සහනදායී අනුපාත යටතේ ආරක්ෂිත තැන්පතු සේප්පු[2]

*[2]වැඩිවිස්තර සඳහා කරුණාකර නේෂන්ස් ට්‍රස්ට් බැංකුවේ පුද්ගල බැංකු ගාස්තු මාර්ගෝපදේශය වෙතයොමුවෙන්න([www.nationstrust.com/fees-and-charges](www.nationstrust.com/fees-and-charges))*

## 1.3 වත්කම් සැලසුම් සේවය

පුද්ගලයෙකුගේ මරණින් පසු ඔහුගේ වත්කම් සංරක්ෂණය කිරීම, කළමනාකරණය කිරීම සහ බෙදා වෙන් කිරීම කෙසේ සිදු කරන්නේ ද යන්න සැලසුම් කිරීමවත්කම් සැලසුම් කිරීම යනුවෙන් අදහස් වේ. ඔහු/ඇය අකර්මණ්‍ය වූ අවස්ථාවකදී ඔහුගේ හෝ ඇයගේ දේපළ සහ මූල්‍ය වගකීම් කළමනාකරණය කිරීම ද මෙයටඅයත්වේ. නිවාස, වාහන, කොටස් මිලදී ගැනීම්, සිතුවම්, ජීවිත රක්ෂණය, විශ්‍රාම වැටුප් සහ ණය යනාදියෙන් පුද්ගලයෙකුගේ

වත්කම් සමන්විත වේ.වත්කම් සැලසුම් කිරීම සඳහා පුද්ගලයන්ට විවිධ හේතු බලපාන අතර පවුලේ ධනය සුරැකීම, ජීවත්ව සිටින භාර්යාවට/සැමියාට සහ දරුවන්ට උරුම කර දීම, දරුවන් සහ/හෝ මුණුපුරන්ගේ අධ්‍යාපනය සඳහා අරමුදල් සම්පාදනය හෝ ඔවුන්ගේ වත්කම් පුණ්‍ය කටයුත්තක් වෙනුවෙන් වෙන් කර දීම වැනි පරමාර්ථ ඒ අතර ප්‍රධාන හේතු ලෙස සඳහන් කළ හැකිය.

එබැවින්, අපගේ බාහිර විශේෂඥ මණ්ඩලය ඔබේ ජීවිත ඉලක්ක සපුරා ගැනීම සඳහා පහත දැක්වෙන සේවාවන් ලබා දීමට සූදානම්ව සිටියි.

- අවසන් කැමැති පත්‍ර හෝ සංසෝධිතඅවසන් කැමැති පත්‍ර සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම
- තෙස්තමේන්තුකරුගේ දේපළ පිළිබඳ විශ්වාසයක් ඇතිවන අකාරයට අන්තිම කැමති පත්‍ර සකස් කිරීම
- තෑගි ඔප්පු සකස් කිරීම

*වැදගත්: නේෂන්ස් ට්‍රස්ට් බැංකුවේ පී.එල්.සී විසින් වත්කම් සැලසුම් කටයුතු පිළිබඳ විශේෂ නිපුණතාවක් ඇති නීති සමාගමකට ඔබව හඳුන්වා දීම පමණක් සිදු කරන අතර එම නීති සමාගම විසින් සපයනු ලබන උපදෙස් හෝ සේවාවන් සඳහා බැංකුව වගකීම දරන්නේ නැත. එසේම, නීති සමාගමක් විසින් සපයනු ලබන සේවා කටයුතු සම්බන්ධ ගාස්තු එකී නීති සමාගමට ගෙවිය යුතුය.*

### 1.4 කලා උපදේශක සේවය

වෙළඳපල අස්ථාවරත්වය පිළිබඳ අවධානයයොමු කර උද්ධමනය නිසා ඇතිවන බලපෑම අවම කිරීමටත් තම අයෝජන මාර්ග විවිධාංගීකරණයට ලක් කරමින් යම් ලාභයක් උපයා ගැනීමටත් ඉහළ ශුද්ධ වටිනාකමක් ඇති සම්ප්‍රදායිකනොවන මාර්ගීක වත්කම් කෙරෙහි ගනුදෙනුකරුවෝ තම සැළකිල්ල යොමු කරති. එවැනි ගනුදෙනුකරුවන් විකල්ප වත්කම් පිළිබඳ තම අවධානය යොමු කළ හැකිය. 'ලලිත කලාව' වෙළඳපල අස්ථාවරත්වයට සුරක්ෂිතතාවයක් සැපයිය හැකි එවැනි විකල්ප ආයෝජනයකි.මෙයටහේතුවවනුයේ, කලා වෙළඳ පොලේ මිල සාමාන්‍යයෙන් කොටස් වෙළඳපොළේ හෝ වෙනත් වෙළඳපොළක ක්‍රියාකාරීත්වයට සහසම්බන්ධයක් නොමැතිබැවනි. එබැවින්, නේෂන්ස් ට්‍රස්ට් Private Banking සේවය යටතේ ඔබගේ සිතුම් පැතුම් සාක්ෂාත් කරලීමේ අරමුණින් හා ඔබගේ අවශ්‍යතාවයට ගැළපෙන සේවාවන් රාශියක් සපයන 'කලා උපදේශ සේවාවක්' අප සතුව ඇත. ඇත්තේන්ම, කලාව යනු නිර්මාණශීලීත්වයට ආදරය කිරීමක් වන අතර එය බොහෝ දෙනෙකුගේ නොසංසිඳෙන ආශාවකි.

- ශ්‍රී ලාංකික හා දකුණු ආසියානු, සියලුම කාණ්ඩවල කලා කෘති අත්පත් කර ගැනීම් සහ අලෙවිය පිළිබඳ උපදෙස්
- කලා කෘති බැහැර කිරීමේ උපාය මාර්ගයස්ථිරව රඳවා තබා ගැනීම නිර්ණය කිරීම සඳහාරැස්කල කලා කෘති ඇගයීම.
- කලා කෘති සත්‍යාපනය, ඇගයීම හා කලා කෘතියේ මූලාරම්භය හා තත්වය පිළිබඳ විමර්ශනය
- පුද්ගලික සාකච්ඡා වලදී හා වෙන්දේසි වලදී සේවාදායක නියෝජනය කිරීම
- ගැනුම්කරුවන්ගේ ඉල්ලීම මතවිශේෂිත ස්ථානයක්සඳහා නිර්මාණය කරන ලද කලා කෘති සංවිධානය කිරීම
- කලා කෘති එකතුවක් අළුත් කිරීම, නව මුහුණුවරක් දීම ඇතුළු සකස් කිරීමේ සේවාව
- කලා කෘති එකතුව ලේඛනගත කිරීම, කලා කෘතිවල මූලාරම්භය හා ඒ සම්බන්ධ තොරතුරු ඇතුළත් ප්‍රදර්ශනයටසුදුසුපොතක්නිර්මාණයකිරීම(Coffee table book)

- කලා කෘති ප්‍රවාහනය, බෙදාහැරීම සහ ස්ථාපනය කිරීම
  (සස්කියා ප්‍රනාන්දු කලාගාරයෙන්- Saskia Fernando Gallery හරහා ලබාගත් කලා නිර්මාණවලට)

**අනෙකුත් කලා ප්‍රතිලාභ**

- Private Banking සස්කියා ප්‍රනාන්දු කලාගාරයෙන් සිදු කරන ලද මිලදී ගැනීම් වෙනුවෙන් බෙදාහැරීමේ ගාස්තු අය කිරීමකින් තොරව නොමිලේ ප්‍රවාහනය (කොළඹ නගර සීමාව තුළ)

*වැදගත්: නේෂන්ස් ට්‍රස්ට් බැංකුවේ පී.එල්.සී.විසින් කලා කටයුතු පිළිබඳ විශේෂ නිපුණතාවක් ඇති සමාගමකට ඔබව හඳුන්වා දීම පමණක් සිදු කරන අතර එම සමාගම විසින් සපයනු ලබන උපදෙස් හෝ සේවාවන් සම්බන්ධයෙන් බැංකුව වගකීම දරන්නේ නැත. එසේම, කලාව වැනි විකල්ප ආයෝජන ඉහළ ද්‍රවශීලතාවක් ඇති වත්කම් නොවන අතර මධ්‍යගත වෙළඳපලක් හරහා (එනම් කොටස් හුවමාරුව වැනි) වත්කම් බැහැර කළ නොහැකිය.*

**1.5 බැංකුව ඔබේ නිවසටම[3]**

Private Banking සාමාජිකයෙකු වශයෙන් ඔබට අපගේ විශේෂයෙන් හඳුන්වා දී ඇති ක්ෂණික දුරකථන අංකය ඇමතීමෙන් ඔබගේ ගනුදෙනු කටයුතු සිදු කළ හැකි අතර ඔබගේ නිවසට, කාර්යාලයට හෝ ඔබ කැමති වෙනත් ඕනෑම ස්ථානයකට ඔබේ පහසුව පරිදි පුළුල් පරාසයකින් යුත් සේවා රාශියක් ලබාගැනීමටහැකියාවඇත. බැංකුව ඔබේ නිවසටමයන මෙමසේවාවයටතේ 011 4711 400 යන දුරකථනය ඇමතීමෙන් පහත දැක්වෙන සේවාවන් ලබා ගත හැකිය:

- මුදල් ආපසු ගැනීම් හෝ තැන්පතු
- තෙවන පාර්ශව මුදල් බෙදා හැරීම්
- චෙක්පත් තැන්පතු (ආදායකයාගේ ගිණුමට පමණි).
- American Express ණය කාඩ්පත් පියවීම
- American Express මුදල් අත්තිකාරම්

**වෙනත්විස්තර**

- ඉල්ලීමක්කර පැයක් ඇතුළත ගනුදෙනු කටයුතු සිදුකෙරේ (ව්‍යාපාර ගනුදෙනුකරුවන් - පැය දෙකක් ඇතුළත)
- එක්පැමිණීම්වාරයකදීරුපියල්500,000ක්දක්වාවූ ගනුදෙනු ඉටු කර ගත හැකිය
- මසකටඋපරිමපැමිණීම්වාරසංඛ්‍යාව 6 කි
- එක්පැමිණීම්වාරයකදී උපරිම ගනුදෙනු වටිනාකමදක්වා බහුවිධ ගනුදෙනු සිදු කළ හැකිය
- රජයේසහබැංකුනිවාඩුදිනද ඇතුළත්ව ශාඛාවගනුදෙනුක්‍රියාත්මකකරනවෙලාවතුලසේවාව ලබා ගත හැකිය
- කොළඹසහනගරාසන්නප්‍රදේශවලමෙන්මමහනුවර, පේරාදෙණිය, ගාල්ල, කුරුණෑගල,රත්නපුරසහවෙන්නප්පුව යන ශාඛා වලට කි.මී. 10 ක දුරින් දැනට මෙම සේවාව ලබා ගත හැකිය
- බැංකුව ඔබේ නිවසටම සේවාව පහත සඳහන් දිනවලදී ලබා ගත නොහැකිය.
- සතිඅන්තදිනයන්
- පෙබරවාරි 04 - නිදහස් දිනය

- අප්‍රේල් 13 - සිංහල සහ දෙමළ අලුත් අවුරුදු දිනය
- අප්‍රේල්14 - සිංහල සහ දෙමළ අලුත් අවුරුදු දිනයට පසුදින
- මැයි 01 - මැයි දිනය
- වෙසක් පොහෝ දිනය
- වෙසක් පෝයට පසු දින
- දෙසැම්බර් 25 - නත්තල් දිනය

[3]බැංකුව ඔබේ නිවසටමසේවාව පිළිබඳ යාවත්කාලීන තොරතුරු සඳහා වෙබ් අඩවියට පිවිසෙන්න(www.nationstrust.com/fees-and-charges)

## 1.6 විශේෂිත ණය කාඩ්පත්, ණය හා අයිරා පහසුකම්[4]

### 1.6.1 පුද්ගලික ණය

අපගේ ගනුදෙනුකරුවන්ට ඔවුන්ගේ සියලුම පුද්ගලික අවශ්‍යතා බාධාවකින් තොරව වඩාකාර්යක්ෂමව ඉටු කර ගැනීමට පුද්ගලික ණය උපකාරී වේ. මාස 12 සිට 84 දක්වා වූ ආපසු ගෙවීමේ කාල පරාසයක් සඳහා ණය ලබා ගත හැකි අතර සමාන මාසික වාරික වලින් ආපසු ගෙවිය හැකිය. ඔබේ අවශ්‍යතාවය අනුව පොලී අනුපාතය විචල්‍ය හෝ ස්ථාවර විය හැක. ඔබේ සබඳතා කළමනාකරුගේ පුද්ගල කේන්ද්‍රිය සේවාව මඟින් වැඩ කරන දින 5ක් ඇතුළත ඔබේ ගිණුමට අරමුදල් කිසිදු අවහිරතාවයකින් තොරව බැර කිරීමට සහතික වේ.

### 1.6.2 නිවාස ණය පහසුකම්

ඔබට නව නිවසක් මිලදී ගැනීමට හෝ ගොඩ නැගීමට, එසේත් නැත්නම් ඔබේ නිවසට නව කොටසක් එකතු කිරීමට අවශ්‍යවූවිටකදීනේෂන්ස් නිවාස ණයතුලින්ඔබඅපෙක්ෂාකරනසහඔබ්බටගියසේවාවක්ඔබටලබාගතහැක.සරලහා පහසුක්‍රියාවලියක්වනමෙයටඅපගේ කාර්ය මණ්ඩලය ඔබට අවශ්‍ය ලියකියවිලි සම්පූර්ණ කිරීමේ සිට ඔබේම කිව හැකි ඉඩමක් හිමිකර දීම දක්වා වූ සෑම කටයුත්තකදීම ඔබට සහාය වීමටද සැදී පැහැදී සිටියි.

නිවාස ණය වර්ග

- ඉඩම්මිලදීගැනීම
- සහාධිපත්‍ය දේපල (Condominium)
- නිවසක්ඉදිකිරීම
- නිවසක්මිලදීගැනීම

ස්ථාවර වාරිකවලින් ගෙවිය යුතු නිවාස ණය ලබා දෙන්නේ වැටුප් ලබන ගනුදෙනුකරුවන් සඳහා පමණි.

### 1.6.3 කල්බදු ණය පහසුකම්

ඔබගේ අවශ්‍යතාවයට ගැළපෙන පරිදි,ලෙහෙසියෙන්ඔබගේ වාහනය මිලදී ගැනීම සඳහා නිර්මාණය කරන ලද සුවිශේෂී පැකේජයක් තුළ වේගවත් සහ පහසුවෙන්කල්බදු ණය විසඳුම් අපි ඔබට ලබා දෙන්නෙමු. කල්බදු ණය විසඳුම් පෙළකින් ඔබේ අවශ්‍යතාවයට ගැළපෙන විසඳුමතෝරා ගැනීමේ හැකියාව ඔබට ඇත. තවද, අප වෙතින් කල්බදු ණය පහසුකමක්ලබාගන්නාඔබට, රක්ෂණ වාරිකයට වට්ටම් ලබා ගැනීමේ හැකියාවද ඇත.

**1.6.4 ආන්තික වෙළඳ පහසුකම්**

කොළඹ කොටස් හුවමාරුවේ කොටස්වල මිත් මතු ආයෝජනය කරන විට ඔබට මෙම පහසුකම උපකාරී වනු ඇත. බැංකුව විසින් සපයනු ලබන ණය පහසුකමකින් කොටස් වෙළඳ පොලේ ආයෝජනය කිරීමට මෙම සේවාව තුළින් ඔබට ඉඩ ප්‍රස්ථාව ලබා දෙනුඇත.

**1.6.5 බැංකු අයිරා පහසුකම්**

ඔබගේ දෛනික හෝ තාවකාලික මූල්‍ය අවශ්‍යතා වෙනුවෙන් ලබා දෙනු ලබනණය පහසුකමකි. මුදල් හෝ දේපල, ඇපයක් වශයෙන් තැබීමෙන්මෙමපහසුකමලබාගතහැක.

**1.6.6 American Express® ණය කාඩ්පත්**

පිළිගැනීමක් ඇති American Express ණය කාඩ්පතින් ඔබට ප්‍රතිලාභ රැසක් භුක්ති විඳිය හැකිය. American Express ණය කාඩ්පත මඟින් සාමාජිකත්ව දිරිගැන්වීමේ වැඩසටහන, ගාස්තු රහිත සංචාරක රක්ෂණ සැලසුම් හා ලෝකයේ ඕනෑම තැනක සිට ඔබේ මූල්‍ය ගනුදෙනු සුරක්ෂිතව ඉටු කර ගැනීමට උපකාරී වන අද්විතීය හදිසි ආධාර සේවාව වැනි නොයෙක් ප්‍රතිලාභ ඔබට භුක්ති විඳිය හැක. American Express ණය කාඩ්පත් හිමියෙකු වශයෙන් ලොව පුරා මිලියන ගණනක සේවා ආයතන ඔබව සාදරයෙන් පිළිගනු ඇත. ඔබ අවන්හලකආහාර ගැනීමේදී, සාප්පු සවාරි යැමේදී හෝ විවේක සහ/හෝ ව්‍යාපාර කටයුතු වෙනුවෙන් සංචාරය කරන විට American Express ණය කාඩ්පත ඔබේ විශ්වාසවන්තසහකරුලෙසසැලකියහැකිය.

ලොව පුරා 600,000කට වඩා ඇති ATM යන්ත්‍ර මඟින් ඔබට  මුදල් ලබා ගත හැකි අතර ඔබගේ ලබාගත හැකි ශේෂයට යටත්ව ණය සීමාවෙන් 50% ක උපරිම මුදලක් ආපසු ලබා ගැනීමේ හැකියාව පවතී. නේෂන්ස් ට්‍රස්ට් බැංකුවේ සියලුම Private Banking  ගනුදෙනුකරුවන් American Express® Platinum ණය කාඩ්පතකට හිමිකම් කියන අතර  සම්බන්ධ වීමේ ගාස්තු සහ පළමු වසරේ වාර්ෂික ගාස්තු ගෙවීමෙන් නිදහස් කරනු ලැබේ.

**1.6.6.1 අතිරේක ණය කාඩ්පත් (වර්තමාන ණය කාඩ්පත් සාමාජිකයන් සඳහා)**

වර්තමාන ණය කාඩ්පත් හිමියෙකු වශයෙන් ඔබට හිමිවන ප්‍රතිලාභයක් ලෙස ඔබගේ පවුලේ සාමාජිකයෙකුට සම්බන්ධ වීමේ ගාස්තු අය කිරීමකින් තොරව අතිරේකAmerican Express® කාඩ්පතක්  ලබා දීමට කටයුතු කරමු.

**1.6.6.2 නේෂන්ස් ට්‍රස්ට් MasterCard**USD හා**EuroTravel කාඩ්පත්**

බුද්ධිමත්වසංචාරයකිරීම සඳහානව නේෂන්ස් ට්‍රස්ට් MasterCardUSD හා Euro Travel කාඩ්පත්භාවිතා කරන්න! MasterCard USD Travel යනු ඩොලර් හෝ යුරෝ මුදල් ඒකක වලින් සමන්විත නේෂන්ස් ට්‍රස්ට් බැංකුවෙන් මිලදීගත හැකි පෙරගෙවුම් කාඩ්පතකි. දැන්ඔබට ලොව පුරා සංචාරය කළ හැකි අතර ඔබට අවශ්‍ය විටෙක ඇමරිකානු ඩොලර් හෝ යුරෝ මුදල් ලබාගතහැක. MasterCard පිළිගන්නා ලෝකයේ ඕනෑම තැනක ඕනෑම ආයතනයකට මේ මඟින්ගෙවීම් කළ හැකිය. ඔබ ලෝකයේ කොතැනක සිටියත් ඕනෑම MasterCard ATM යන්ත්‍රයකින් මුදල් ලබා ගැනීමටද ඔබට එය භාවිතා කළ හැකිය.

*[4]ණය කාඩ්පත්, ණය, කල්බදු සහ බැංකු අයිරා පහසුකම් පිළිබඳ යාවත්කාලීන තොරතුරු සඳහා කරුණාකර නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් පවත්වා ගෙන යනු ලබන වෙබ් අඩවියට පිවිසෙන්න. ණය කාඩ්පත්, ණය, කල්බදු*

*සහ බැංකු අයිරා පහසුකම් බැංකුව විසින් දැනට අනුගමනය කරනු ලබන නිර්ණායකවලට යටත්වලබාදෙනුලැබේ.(www.nationstrust.com/fees-and-charges)*

**1.7 අයෝජන හා තැන්පත් ගිණුම්**

**1.7.1 ජංගම ගිණුම්[5]**

නේෂන් ට්‍රස්ට් බැංකුවේ ජංගම ගිණුමක් පවත්වා ගෙන යාමේන් ඔබගේ මුදල් පහසුවෙන් කළමනාකරණය කර ගැනීමේ හැකියාව ඇත. එය ඔබගේ දෛනික ගනුදෙනු සිදු කර ගැනීමට ඇති පහසුම ක්‍රමය වේ. ඔබගේ දෛනික බැංකු කටයුතු ඉටු කර ගැනීම සඳහා ඔබටසුවිශේෂිවූවෙක් පොතක් සහ හරපතක් (Debit Card) ලැබෙනු ඇත.

**1.7.2. දේශිය මුදල් ඉතිරිකිරීම් ගිණුම**

**1.7.2.1 නේෂන්ස් සේවර්**

නේෂන්ස් සේවර් මඟින් ඔබට ඉතිරි කිරීමට අනගි අවස්ථාවක් ලබා දෙයි.ඔබගේ දෛනික මුදල් ගනුදෙනු වඩාත් පහසුවෙන් කාර්යක්ෂමව ඉටු කර ගැනීමට උපකාරී වන විශේෂාංග රාශියක් ලබා දෙයි.

නේෂන්ස් සේවර් ඔබේ ඉතුරුම්වලට ඉහළම ප්‍රතිලාභ ලබා ගැනීමට ඔබට උපකාරී වන අතර අපගේ ස්ථිරපොලී අනුපාත ව්‍යුහය අනුව ඔබගේ ඉතිරි කිරීම් වැඩිවන තරමට ඔබට ලැබෙන පොලී අනුපාතයද වැඩි වේ.

**1.7.2.2 නේෂන්ස් උපරිම බෝනස් ඉතුරුම් ගිණුම**

නේෂන්ස් උපරිම බෝනස් ඉතුරුම් ගිණුමමඟින් ගිණුමේ පවත්වාගෙන යන ශේෂයට ගෙවන සම්මත පොලියට අමතරව 60% දක්වා ප්‍රසාද පොලියක් ගනුදෙනුකරුවන්ට ලබා දීරුපියල් 100,000ක් වටිනා ජීවිත රක්ෂණ ආවරණයක්දනොමිලේ ලබා දෙනගිණුමකි.

**1.7.2.3 නේෂන්ස් මේගා සේවර්**

නේෂන්ස් මේගා සේවර් ගිණුමේ ඉතිරි කිරීම තුළින් ඉහළ පොලීයක් සහ තවත් බොහෝ ප්‍රතිලාභ අත් විඳිය හැකිය. රුපියල් 500,000ක අවම තැන්පතුවකින් ඇරඹිය හැකි නේෂන්ස් මේගා සේවර් ගිණුමකින්ඔබේ ඉතුරුම් සඳහා අමතර පොලියක්ලබාගතහැක.

**1.7.2.4 නේෂන්ස් ළමා ගිණුම**

ගිණුමේ ශේෂයට ඉහළ පොලියක් ලබා දෙන නේෂන්ස් ට්‍රස්ට් බැංකුවේ ළමා ඉතුරුම් ගිණුමක් විවෘත කිරීමෙන් ඉතුරුම්වල වටිනාකම දරුවන්ට අවබෝධ කරලීමට හැකි අතර ආකර්ෂණීය ප්‍රතිලාභ පිරිනැමීම මඟින් ඉතිරිකිරීමටඅපේදරුවන්ව දිරිමත් කළ හැකිය.

**1.7.2.5 විදේශිය මුදල් ඉතිරි කිරීම් ගිණුම**

ඔබගේ විදේශ මුදල් වර්ධනය කර ගැනීමට සරල සහ නම්‍යශීලී ක්‍රමයක් විදේශිය මුදල් ඉතිරි කිරීම් ගිණුම් මඟින් ඔබටලබා දෙන අතර ඒ තුළින් තරඟකාරී දෛනික පොලී ඉපැයීම්වල ප්‍රතිලාභ සහ ඉතිරිකිරීමේ පහසුව භුක්ති විඳීමේ අවස්ථාවද හිමි වේ.

**1.7.3. නේෂන්ස් සැලරි සේවර්**

නේෂන්ස් සැලරි සේවර් ගිණුම ඔබගේ මූල්‍ය අවශ්‍යතාවලට ගැළපෙන සේවාවන් රාශියක් සපයයි. ගිණුම සමග ලබා දෙන විශේෂාංග මඟින්, ඔබ වෘත්තීය ජීවිතයේ ප්‍රගතියක් ලබන විට ඔබට අගය එකතු කිරීම් ලබා දෙන එකම ගිණුම ලෙස නේෂන්ස් සැලරි සේවර් හැඳින්විය හැකිය.

### 1.7.4 ආයෝජන ගිණුම්

#### 1.7.4.1 කාලීන තැන්පතු ගිණුම් (සියලු මුදල් ඒකක)

ස්ථාවර තැන්පතු ඔබට ඉහළම ප්‍රතිලාභ හිමිකර දෙන අතර විවිධවිදේශ මුදල් ඒකක වලට අමතරව, විවිධ කාල සීමාවන් සඳහා ඔබගේ අරමුදල් ආයෝජනය කිරීමේ අවස්ථාවද හිමිකර දෙයි. ස්ථාවර තැන්පතු අවම වශයෙන් මාස 1,2,3 සහ 12 වශයෙන් හෝ අවුරුදු 2,3 සහ 5 දක්වා තැන්පත් කළ හැකිය (විදේශ මුදල් ස්ථාවර තැන්පතු වශයෙන් අයොජනය කළ හැක්කේ උපරිම මාස 12 දක්වා වූ කාල සීමාවක් සඳහා පමණි). කල්පිරීමේදී ස්වයංව අලුත් කිරීමේ අවස්ථාව නිසා ඔබගේ මුදලට අඛණ්ඩ පොලියක් සහතික කෙරේ.

#### 1.7.4.2 නේෂන්ස් පුද්ගලික ආයෝජන සැලැස්ම (NPIP)

නේෂන්ස් පුද්ගලික ආයෝජන සැලැස්ම මඟින් ඔබගේ අනාගත අවශ්‍යතා සුරක්ෂිත කිරීමට උපකාරී වනු ඇත. ඔබේ ආයෝජනය සඳහා ආකර්ෂණීය සහතිකපොලී අනුපාතයක් සමග රුපියල් මිලියන 2ක් වටිනා නොමිලේ ජීවිතාරාක්ෂණයක්ද ලබා දේ.

#### 1.7.4.3 නේෂන්ස් විදේශ මුදල් ඒකක ආයෝජන සැලැස්ම (USD)

නේෂන්ස් විදේශ මුදල් ආයෝජන සැලැස්ම මඟින් ඔබට ලෝකයේ ඕනෑම තැනක සිට ආයෝජනය කිරීමේ අවස්ථාව හිමිවන අතර ඔබට මෙන්ම ඔබගේ පවුලට වඩාදීප්තිමත්අනාගතයක් සඳහා සැලසුම් කිරීමේ ඉඩකඩ සලසා දේ.

#### 1.7.4.4 ඇමතුම් තැන්පතු

විදේශ මුදල් තැන්පතු දේශීය මුදල් තැන්පතු බවට පරිවර්තනය කර ආයෝජනයෙන් ඉහළ ප්‍රතිලාභයක් උපයාගත හැකි අතර ඔබගේ උපචිත ශේෂයට කෙටි කාලීන පොලී ගෙවීමේ වාසිය සමග ඇමතුම් තැන්පතු ගිණුමක පහසුව භුක්ති විඳින්න.

#### 1.7.4.5 නේෂන්ස් ළමා ආයෝජන සැලැස්ම (NKIP)

ඔබේ දරුවන්ගේ අනාගතය සුරක්ෂිත කිරීමට මෙන්ම ඔවුන්ගේ සිහින සාක්ෂාත් කර ගැනීම සඳහා ඔවුන්ට සහාය වීම මෙම ආයෝජන සැලැස්මේ ප්‍රමුඛතාවයක් වන අතර නේෂන්ස් ළමා ආයෝජන සැලැස්ම ඔබට එම වගකීම ඉටු කර ගැනීමට උපකාරී වේ. සාමාන්‍ය මාසික තැන්පතුවකින් අරම්භ කළ පසු ඔවුන්ගේ අනාගතය සුරක්ෂිත කරන අරමුදලක් ගොඩනැගීම වෙනුවෙන් අපි ඔබට උදව් කරන්නෙමු.

### 1.7.5 බැංකු රක්ෂණය

- ඒ්පුද්ගලයින්ගේ ජීවන රටාවට ගැළපෙන රක්ෂණ සැලසුම්/ආයෝජන අවස්ථා රාශියක් නේෂන්ස් ජීවිත රක්ෂණය සතුව ඇති අතර යුනියන් ඇෂුවරන්ස් ලිමිටඩ් විසින් රක්ෂණ සැලසුමේ වගකිම බාර ගෙන නිකුත් කරනු ලැබේ.

**නේෂන්ස් ජීවිත රක්ෂණය යටතේ පිරිනැමෙන නිෂ්පාදන**

- නේෂන්ස්රක්ෂණයසුපිරි
- නේෂන්ස් රක්ෂණය ප්‍රාග්ධන
- නේෂන්ස් සමුහ ජීවිත විසඳුම්

*[5]සියලුම ආයෝජන සහ තැන්පතු නිෂ්පාදන පිළිබඳ යාවත්කාලීන තොරතුරු සඳහා කරුණාකර නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් පවත්වා ගෙන යනු ලබන වෙබ් අඩවියට පිවිසෙන්න.සියලුම නිෂ්පාදන අයිතමයන් බැංකුවේ පවතින විශේෂ වැඩසටහන් හා මිල නියම කිරීමේ මාර්ගෝපදේශයට යටත් වේ.(www.nationstrust.com/fees-and-charges)*

**1.8 ගෙවීම් හා මුදල් කළමනාකරණ සේවය[6]**

**1. 8.1 අන්තර් ජාතික /දේශිය ගෙවීම් සේවා**

**1.8.1.1 දේශිය ගෙවීම් සේවා**

දේශිය ගෙවීම් සේවා මඟින් ඔබට කැමති අරමුදල් හුවමාරු ක්‍රමයක් හරහා රට තුළ නිදහසේ ගනුදෙනු කිරීමට අවස්ථාව ලබා දේ. දේශීයගෙවීම් සේවා සඳහා ඇති විකල්ප අවස්ථා පහත පරිදි දැක්වේ:

**1.8.1.1.1 තත්‍යකාලීනදළගෙවීම්(Real Time Gross Settlement)**

තත්‍ය කාලීන දළ ගෙවීම්ක්‍රමයේදී ගනුදෙනුකරු විසින් දෙනු ලබන උපදෙස් වලට අනුව ශ්‍රී ලංකා රුපියල් ඒකක වලින් ඇති අරමුදල් එක් බැංකුවකින් තවත් බැංකුවටයැවියහැක. මෙම පැවරීම SWIFT ක්‍රමය හරහා සිදු කරනු ලබන අතර අරමුදල් එදිනම යැවියහැක.

**1.8.1.1.2 ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් ක්‍රමය(Sri Lanka Interbank Payment Systems)**

ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් ක්‍රමය (SLIPS)මඟින් එක් බැංකු ගිණුමකින් තවත් බැංකු ගිණුමකට මුදල් යැවිය හැකිය. එය දේශිය බැංකු දෙකක් අතර අරමුදල් හුවමාරු කිරීමේ කඩිනම් ක්‍රමවේදයක් වන අතර එහිදී ලැබෙන මුදල් ගනුදෙනුකරුගේ ගිණුමට ඊළඟ වැඩ කරන දිනයේදී ම බැර කෙරේ.

**1.8.1.1.3පොදු ඉලෙක්ට්‍රොනික අරමුදල් හුවමාරු ස්විචය (Common Electronic Fund Transfer Switch)**

පොදු ඉලෙක්ට්‍රොනික අරමුදල් හුවමාරු ස්විචය (CEFTS) මඟින් ගනුදෙනුකරුවන්ට ඔවුන්ගේ පහසුව පරිදි දේශීය බැංකු අතර අරමුදල් හුවමාරු කිරීම තත්‍ය කාලීනව සිදු කිරීමට ඉඩ සලසන ක්‍රමයකි.

**1.8.1.2ජාත්‍යන්තර ගෙවීම් සේවා**

ඔබ ගනුදෙනු කිරීමට අපේක්ෂා කරන පාර්ශවය සමග විදේශ මුදල් හරහා ගනුදෙනු කිරීමේ අවස්ථාව ජාත්‍යන්තර ගෙවීම් සේවා මඟින් ඔබට හිමි වේ. ජාත්‍යන්තර ගෙවීම් සේවා සඳහා පවතින විකල්ප අවස්ථා පහත දැක්වේ:

**1.8.1.2.1 බාහිර විදුලි පණිවුඩ පැවරීම් (Outward Telegraphic Transfer)**

බාහිර විදුලි පණිවුඩ පැවරීම්(OTT) යනු නේෂන්ස් ට්‍රස්ට් බැංකුවේ සිට වෙනත් බැංකුවකට විද්‍යුත් පණිවිඩ හුවමාරුවකින් විදේශ මුදල් හුවමාරු කර ගත හැකි ක්‍රමයකි. ඕනෑම දේශීය හෝ විදේශීය බැංකුවකට මෙසේ අරමුදල් යැවිය හැකිය.

**1.8.1.2.2 අභ්‍යන්තර විදුලි පණිවුඩ හුවමාරු (Inward Telegraphic Transfers)**

අභ්‍යන්තර විදුලි පණිවුඩ හුවමාරු **(ITT)** යනු **SWIFT** ක්‍රමය හරහා විදේශීය හෝ දේශීය බැංකුවකින් එක් පුද්ගලයෙකුගෙන් තවත් පුද්ගලයෙකුට අරමුදල් ලැබෙන අභ්‍යන්තර ගෙවීම් ක්‍රමයකි.

**1.8.2 විදේශ මුදල් නිකුත් කිරීම**

විදේශ මුදල් නිකුත් කිරීම මඟින් ඔබගේ විදේශ ගමන් අවශ්‍යතා සඳහා පහසුකම් සැලසිය හැකි අතර එවැනි නිකුත් කිරීම් විනිමය පාලන රෙගුලාසි යටතේ ක්‍රියාත්මක කොන්දේසි වලට යටත් වේ.

*[6]සියලුම ගෙවීම් සහ මුදල් කළමනාකරණ සේවා පිළිබඳ යාවත්කාලීන තොරතුරු සඳහා කරුණාකර නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් පවත්වා ගෙන යනු ලබන වෙබ් අඩවියට පිවිසෙන්න. සියලුම නිෂ්පාදන බැංකුවේ පවතින විශේෂාංග,මිල නියම කිරීමේ මාර්ගෝපදේශයට යටත් වේ.(www.nationstrust.com/-fees-and-charges)*

**1.9 බහුවිධ මාර්ග ඔස්සේ ප්‍රවේශ වීමේ හැකියාව[7]**

**1.9.1 නේෂන්ස් ට්‍රස්ට් බැංකුවේ ශාඛා ජාලය සහ වසරේ දින 365 පුරාම ක්‍රියාත්මක බැංකු සේවය**

වසරේ දින 365 පුරාම ක්‍රියාත්මක විය යුතු යන නේෂන්ස් ට්‍රස්ට් බැංකුවේ ප්‍රතිපත්තිය මතPrivate Banking දපදනම්වීඇත. අපගේ ශාඛා බොහොමයක් වසරේ දින 365ම පුරාම විවෘතව තැබේ. එයිනුත් ශාඛා රුසක්ප.ව. 6.00 දක්වා ක්‍රියාත්මක වන අතර ප්‍රධානනගරවලපිහිටා ඇති බැංකු ශාඛා කිපයක් ඔබගේ පහසුව සඳහාප.ව. 8.00 දක්වා විවෘතව තැබේ. අපගේප්‍රධානබැංකුශාඛාවලකැපවුකවුන්ටරහාසේවාපරිශ්‍රයන්මඟින්Private Bankingගනුදෙනුකරුවෙකුලෙසඔබටවිශේෂඅවධානයක්සහඅසමසමසේවාවක්ලබාදීමටඅපකටයුතුකරඇත.

**1.9.2 බැංකුව ඔබේ නිවසටම**

මෙය Private Banking ගනුදෙනුකරුවන්ට ලබා දෙන සුවිශේෂී පහසුකමක් වන අතර 011 4711 400 යන දුරකථන අංකයට ඇමතීමෙන් ඔබට අවශ්‍ය සේවාව, ඔබ කැමති ස්ථානයකට ලබා දීමට අපි කටයුතු කරමු.

**1.9.2.1 මුදල් ආපසු ගැනීම්**

ඔබේ ඕනෑම ගිණුමකින් මුදල් ලබා ගැනීමට හෝ ඔබේ American Expressණය කාඩ්පතෙන් මුදල් අත්තිකාරම් ලබා ගත හැකි අතර,බැංකුව ඔබේ නිවසටමසේවාව මඟින් ආවරණයවනප්‍රදේශය තුළ ඔබ කැමති ස්ථානයකට එම මුදල් ලබා දීමට කටයුතු කරනු ඇත.

**1.9.2.2 තෙවන පාර්ශවය විසින් මුදල් ආපසු ගැනීම්**

බැංකුව ඔබේ නිවසටමසේවාව මඟින් ආවරණයවන ප්‍රදේශය තුළ තෙවැනි පාර්ශවයකට මුදල් ලබා දෙන ලෙසට ඉල්ලීමක් ඔබට කළ හැකිය.මෙම සේවාව භාවිතා කිරීමට පෙර ඔබ ලියාපදිංචි විය යුතු අතර 011 4711 400යන දුරකථන අංකයට ඇමතුමක් ලබා දීමෙන්හෝඅපගේ ළඟම ඇති ශාඛාවට පිවිසීමෙන් මේසේවාව සඳහා ලියාපදිංචි විය හැකිය.

**1.9.2.3 මුදල් තැන්පතු/බිල්පත් ගෙවීම්**

බැංකුවේ පවත්වාගෙන යනු ලබන ඔබගේ ඕනෑම ගිණුමකට මුදල් සහ/හෝ චෙක්පත් තැන්පත් කල හැකිය.

- ජංගම හෝ ඉතුරුම් ගිණුම්වල මුදල්/චෙක් පත් තැන්පතු
- American Express®ණය කාඩ්පත සඳහා ආපසු ගෙවීම්

*වැදගත්:සියලුම මුදල් ආපසු ගැනීම්, තෙවන පාර්ශවයකට මුදල් ලබා දීම සහ තැන්පතු රුපියල් 5000ත් 500,000ත් අතර විය යුතුය.*

**1.9.2.4 චෙනත් තැන්පතු**

රුපියල් චෙක්පත් අදායකයාගේ ගිණුමට පමණක් බැර විය යුතු අතර සම්මත නිෂ්කාශන වේලාවන්ට යටත් වේ.

- බැංකුව විසින් තහවුරුකිරීමෙන් පසු පැයක කාලයක් ඇතුළත ඉල්ලුසේවාවන්ඔබට හිමි වේ.
- ඉල්ලීම කරන අවස්ථාවේදී අවශ්‍ය කරන සියලුම සේවාවන් බැංකුවට දැනුම් දිය යුතුය.
- එක් වරකදී ගනුදෙනු කිහිපයක් සිදු කළ හැකි අතර පැමිණෙන වාර සංඛ්‍යාව පදනම්ව ගනුදෙනුකරුට බිල්පත් නිකුත් කරනු ලැබේ.
- සියලුම Private Banking ගනුදෙනුකරුවන්ටබැංකුව ඔබේ නිවසටමසේවාව නොමිලේ ලබා ගත හැකිය.
- බැංකුවෙන් සහතික කිරීමට පෙර සියලුම අවලංගු කිරීම් සිදු කළ යුතු අතර එසේ සහතික කිරීමේන් පසු සිදුවන ඕනෑම අවලංගු කිරීමක් ගනුදෙනුවක් ලෙස සළකනු ලබන අතර අදාළ නම් ගාස්තු අය කරනු ලැබේ.

### 19.3 සේවය වෙනුවෙන්ම කැප වු Private Banking ක්ෂණික ඇමතුම් අංකය

- පැය24 පුරා කැපවූ Private Banking ක්ෂණික ඇමතුම් අංකය හරහා ඔබගේ ගිණුමට ප්‍රවේශ විය හැකි අතර අපගේ පාරිභෝගික සේවා නිලධාරීන් 011 4711 400 යන ක්ෂණික දුරකථන අංකයමගින්සම්බන්ධ කර ගත හැක.

**පහත සේවාවන් ද ලබා ගත හැකිය:**

### ATM

- ATMකාඩ්පත් සක්‍රිය කර ගැනීම/අවහිර කිරීම
- අලුත්ATM PINඅංකයක්ඉල්ලීම
- රඳවා ගත් කාඩ්පත් නැවත යොමු කරන ලෙස ඉල්ලීම

**හර කාඩ්පත්**

- හර කාඩ්පත් සක්‍රිය කර ගැනීම /අවහිර කිරීම
- අලෙවි ගනුදෙනු සඳහා පමණක් ප්‍රසාද ලකුණු ලබා දීමේන් ප්‍රසාද සීමාව පිරවීම
- අලුත්හර PINඅංකයක් ඉල්ලීම
- රඳවා ගත් කාඩ්පත් නැවත යොමු කරන ලෙස ඉල්ලීම
- ගිණුම් සම්බන්ධ ඉල්ලීම (කාඩ්පතට සම්බන්ධ ගිණුමවෙනස් කිරීම/එකතු කිරීම හෝ කාඩ්පතින් ඉවත් කිරීම)

**මාර්ගගත බැංකුකරණය**

- මාර්ගගතබැංකුසේවාවසක්‍රියකිරීම/ගිණුම්අවහිරතාඉවත්කිරීම
- අලුත්මාර්ගගත බැංකු PINඅංකයක් ඉල්ලීම
- මාර්ගගත බැංකු පහසුකම් සක්‍රීය කිරීම (බිල්පත් ගෙවීමේ විකල්ප අවස්ථා/ තුන්වන පර්ශවයකට අරමුදල් මාරු කිරීමේ විකල්ප අවස්ථා ආදිය,..)

**ජංගම බැංකුකරණය**

- පිවිසීමටජංගම බැංකු **PIN** ඉල්ලීම
- ජංගම බැංකු නැවත සහතික කිරීමේ ඉල්ලීම
- අලුත්ජංගම බැංකු **PIN** අංකයක් ඉල්ලීම
- IMEI අංක වෙනස් කිරීමේ ඉල්ලීම් (අවසන් අංක 2 පමණි)

**බැංකු ප්‍රකාශන ඉල්ලීම**

### 1.9.4 අන්තර්ජාල බැංකුකරණය/ජංගම බැංකුකරණය/කෙටි පණිවිඩ බැංකුකරණය (SMS Banking)

#### 1.9.4.1 අන්තර්ජාල බැංකුකරණය

අපගේ අන්තර්ජාල බැංකු සේවා මගින් ලෝකයේ ඕනෑම තැනක සිට පැය 24 පුරා ඔබගේ ගිණුමට ප්‍රවේශ විය හැකිය.

අන්තර්ජාල බැංකු සේවා මගින් පහත දැක්වෙන සේවා ලබා දේ:

- ඔබගේ සම්පූර්ණ බැංකු ආයෝජනකළඹක්ෂණිකව බලා ගත හැක
- බැංකු ශාඛාවකට නොගොස් ඉතිරිකිරීම් ගිණුම් හා ස්ථාවර තැන්පතු විවෘත කිරීමේ හැකියාව
- ඔබගේ සමාන්‍ය බිල්පත් ගෙවීම් මාර්ගගත ක්‍රමයට කළ හැකිය (දෛනික සීමාව රුපියල්500,000ක් දක්වා)
- ඔබගේසාමාන්‍යගිණුම්අර්ථලාභීන්සමගමුදල්හුවමාරුකරගත හැක(දෛනිකසීමාවරුපියල්1,500,000ක් දක්වා)
- මාර්ගගත ක්‍රමයට ඔබගේ ණය කාඩ්පත් විස්තර බලා ගැනීමේහැකියාව
- ඔබගේ ණය කාඩ්පත් ගෙවීම් මාර්ගගත ක්‍රමය හරහා සිදු කිරීමේහැකියාව
- මාසික විද්‍යුත් ප්‍රකාශන බාගත කර ගැනීමට හැකිය
- වෙනත් ඕනෑමබැංකුවක්සමග මුදල් හුවමාරුවක් මාර්ගගත ක්‍රමය හරහා සිදු කරගත හැක (දෛනික සීමාව රුපියල්500,000ක් දක්වා)
- ස්ථාවර උපදෙස් සැකසීම
- නව චෙක් පොතක් ඉල්ලීම හෝ නිකුත් කරන ලද චෙක්පතකින් කරන ගෙවීමක් නතර කිරීමහෝඅපැහැදිලි චෙක්පත් පිළිබඳ විස්තර ලබා ගැනීම
- බැංකුවට ආරක්ෂිත පණිවිඩ යැවීම සහ බැංකුවෙන් ආරක්ෂිත පණිවිඩ ලබා ගැනීම

### 1.9.4.2 ජංගම බැංකුකරණය

ඔබ කොතැනක සිටියත් ඉතාමත් පහසුවෙන් ඔබේ මූල්‍ය කටයුතු කළමනාකරණය කිරීමටපහතසඳහන් මෙම සුවිශේෂී සේවාපරාසයඔබට අවස්ථාව ලබාදීඇත:

- බැංකු ශාඛාවකට නොගොස් ඉතිරිකිරීම් ගිණුම් හා ස්ථාවර ගිණුම් ක්ෂණිකව විවෘත කිරීමේ හැකියාව
- ඕනෑම වේලාවකනේෂන්ස් ට්‍රස්ට් බැංකුවෙන් අනෙකුත් දේශීය බැංකු ගිණුම් වලටත් අනෙකුත් දේශීය බැංකු ගිණුම්වලින්නේෂන්ස් ට්‍රස්ට් බැංකුවටත් පහසුවෙන් මුදල් යැවීම සහ ලබා ගැනීම
- ඔබගේ ජල, විදුලි වැනි බිල්පත් මෙන්ම ණය කාඩ්පත් ක්ෂණිකව බේරුම් කිරීම (නේෂන්ස් ට්‍රස්ට් බැංකුව හෝ වෙනත් බැංකු)
- ඔබගේ ජංගම දුරකථනයේශේෂයපියවීමහෝ ඔබගේ ජංගම දුරකතන බිල්පත් ක්ෂණිකව ගෙවීම
- ඔබගේ අයෝජන කළඹපහසුවෙන්නිරීක්ෂණයකිරීමේ හැකියාව
- ඔබේ ණය කාඩ්පත,American Express® ණය කාඩ්පත හා MasterCard®පිළිබඳ වාර්තාවක් තබා ගැනීම
- ඕනෑමසේවාවක්ක්ෂණිකවඉල්ලීමටඇතිහැකියාව
- යෙදුමේ(App)තිබෙනවිද්‍යුත්තැපැලයෙන් ආරක්ෂිතව උපදෙස් යැවීම
- පහසු මූල්‍ය ගණනය කිරීම්
- ඔබ කැමති භාෂාවකින් සන්නිවේදනයකිරීම (සිංහල, දෙමළ හෝ ඉංග්‍රිසි)
- ඇඟිලි සළකුණ මඟින්හෝ මුහුණ හෝ කටහඬ හඳුනා ගැනීමමතආරක්ෂිතව ප්‍රවේශ වීම

### 1.9.4.4 FriMi-ශ්‍රී ලංකාවේ පළමු ඩිජිටල් බැංකුව

FriMiශ්‍රී ලංකාවේ ප්‍රථම ඩිජිටල් බැංකුව වන අතර ජංගම පසුම්බිය සහ ගෙවීම් ක්‍රමය යන විශේෂාංග රැසකින් සමන්විත එකම ජීවන විලාසිතායෙදුමවේ.

### 1.9.4.5 විශේෂ සංයුක්ත ප්‍රකාශනය

Private Banking මඟින් ඔබගේ මාසික ගනුදෙනු නිරූපණය කරන මාසික ප්‍රකාශන (ආන්තික වෙළඳ හා ණය කාඩ්පත් තොරතුරු හැර) ලබා දීමට කටයුතු කරයි. ඔබගේ මුළු ගිණුම් ශේෂයන් ලැයිස්තුගත කරමින් ආයෝජන කළඹේ සාරාංශයක් ද සමග ඔබගේ මූල්‍ය තත්ත්වය පිළිබඳ පැහැදිලි හා සවිස්තරාත්මක වාර්තාවක්මෙමඟින් සපයයි.

සම්මත ප්‍රකාශන චක්‍රය සෑම මසකම 1සිට 31දක්වා වේ (ඔබගේ මනාපය අනුව ප්‍රකාශන චක්‍රය වෙනස් කළ හැකිය).

### 1.9.4.6නේෂන්ස් විද්‍යුත් බහළුම (E-Box)

කාර්ය බහුලත්වය නිසා බොහෝ විට ඔබගේ ගිණුම් සහ ණය කාඩ්පත් ප්‍රකාශන මග හැරේ. නමුත් දැන් ඔබට නේෂන්ස් විද්‍යුත් බහළුම හරහා ඔබගේ පූර්ව ගිණුම සහ ණය කාඩ්පත් ප්‍රකාශන සියල්ලම බැලීමටත් සහ බාගත

කර ගැනීමටත් හැකියාව ඇත.නේෂන්ස් විද්‍යුත් බහළම නිසා ඔබගේ සියලුම ප්‍රකාශනඕනෑමවෙලාවකඔබ සතුවතිබේ.

**1.9.4.7 අතපසු වූ දුරකථන ඇමතුම් මඟින් දැනුම්දීම්**

ඔබගේ නේෂන්ස් ට්‍රස්ට් බැංකු ණය කාඩ්පත් හා බැංකු ගිණුම් ශේෂය අතපසු වූ දුරකථන ඇමතුමක් ලබා දීමෙන් ලබා ගත හැකි අතර ඔබේ ශේෂය පරීක්ෂා කිරීම සඳහා පහත අංක වලට ඇමතුමක් ලබා දෙන්න.

- ණය කාඩ්පත් ශේෂය දැන ගැනීමට 011 441 4154 අංකය අමතන්න
- ජංගම හා ඉතිරි කිරීමේ ගිණුම්වල ශේෂය දැන ගැනීමට 0114 711 412 අංකය අමතන්න

[7]සියලුම බහුවිධ සේවාපිළිබඳ යාවත්කාලීන තොරතුරු සඳහා කරුණාකර නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් පවත්වා ගෙන යනු ලබන වෙබ් අඩවියට පිවිසෙන්න. සියලුම නිෂ්පාදන බැංකුවේ පවතින විශේෂාංග,මිල නියම කිරීමේ මාර්ගෝපදේශයට යටත් වේ.(www.nationstrust.com/-fees-and-charges)

## 2. ජීවන රටාව

### 2.1 සංචාරක සහයක වරප්‍රසාද[8]

කාර්යබහුල ජීවන රටාවක් ගෙවන ඔබට බාධාවකින් තොරව සංචාරය කිරීමට අවශ්‍ය වේ. නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් පිරිනමනු ලබන සංචාරක සහයක වරප්‍රසාදය මඟින් බාධාවකින් තොරව ඔබගේ ගමන් බිමන් කටයුතු සිදු කරගැනීමටඅවස්ථාවක්අපටසලසාදියහැක.ප්‍රමුඛ පෙළේ සංචාරකසහ ආගන්තුක සත්කාර සහකරුවෙකුගේ සහය සමග, අපඔබේ විදේශ සංචාර සියල්ලම කාර්යක්ෂමව හා පහසුවෙන් හසුරුවා ගැනීමටඋපකාරකලහැක. අපගේ සේවාවට ඇතුළත් වනුයේ:

- ගුවන් ටිකට් පත් වෙන්කරවා ගැනීම
- හෝටල්වෙන්කරවා ගැනීම
- වීසා සූදානම් කිරීම
- ලබා ගැනීමේ හැකියාව මත වඩා වැඩි පහසුකම් සහිතහෝටල් කාමර
- ලබා ගැනීමේ හැකියාව මත හෝටල්කාමරයටසඳහන්කාලයටපෙරහෝපසුයාම
- ගමන්මළුහාසහයවීමටසහරෝද පුටු සහයක සේවා ඇතුළුව බණ්ඩාරනායකජාත්‍යන්තර ගුවන් තොටුපළේපිළිගැනීමේසේවා සූදානම් කිරීම

මීට අමතරව අපගේ විශේෂ සංචාරක සහකරු හරහා 'සංචාරක පැකේජයක්' මිලදී ගන්නා සියලුම Private Banking ගනුදෙනුකරුවන්ට පහත සඳහන් සේවාවන් ලබා ගැනීමේ හිමිකම ඇත:

- අරලියා විවේකාගාරයට ප්‍රවේශ වීම ඇතුළුව බණ්ඩාරනායක ජාත්‍යන්තරගුවන් තොටුපළේ "සේද මාර්ගයට" පිවිස අති සුඛෝපභෝගී පහසුකම් භුක්ති විඳිමේ අවස්ථාව
- මැකිනන්ස්(Mackinnons)කාර්යාල පරිශ්‍රයේ සේවයට කැප වූ RM සංචාරක හා PBකවුන්ටර්
- කැපවූ සංචාරක ආර්එම් සහ කැපවූ පීබී කවුන්ටරයක්
- නොමිලේදහවල් /රාත්‍රී ආහාරවේලක්
- නොමිලේ සංචාරක රක්ෂණයක්

*[8]සංචාරක සහයක වරප්‍රසාදය මඟින් ලබා දෙන ප්‍රතිලාභ කලින් කලට සමාලෝචනය කරන අතර ලබා දෙන නවතම පහසුකම් පිළිබඳ දැන ගැනීමට කරුණාකර නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් පවත්වා ගෙන යනු ලබන වෙබ් අඩවියට පිවිසෙන්න.(www.nationstrust.com/personal/customer-proposition/private-banking)*

### 2.2 ගුවන්තොටුපළ විවේකාගාර පහසුකම[9]

බණ්ඩාරනායකජාත්‍යන්තරගුවන් තොටුපළේශ්‍රී ලංකා ගුවන් සමාගම මඟින් පවත්වා ගෙන යනු ලබන ‘Palm Strip Lounge’විවේකාගාරයට සීමාරහිතව ප්‍රවේශවීමේ හැකියාව ලබා දෙමින් ඔබගේ විදේශීය සංචාර සැහැල්ලු අත්දැකීමක් කිරීම නේෂන්ස්ට්‍රස්ට් බැංකුවේPrivate Banking හිඅරමුණ වේ. ඔබගේ ‘NTB Private Banking හර කාඩ්පත'Palm Strip Lounge’විවේකාගාරයටපෙන්වාමෙම සුවිශේෂී සාමාජිකත්වය භුක්තිවිඳියහැකිය. ප්‍රාථමික

Private Banking ගිණුම් හිමියන්ට පමණක් මෙම පහසුකම අදාළ වන අතර ඔබ සමග ගමන් කරන වෙනත් මගීන්ට නියමිත ගාස්තු අය කෙරේ.

*[9]ගුවන්තොටුපළ විවේකාගාර පහසුකමමඟින් ලබා දෙන ප්‍රතිලාභ කලින් කලට සමාලෝචනය කරන අතර ලබා දෙන නවතම පහසුකම් පිළිබඳ දැන ගැනීමට කරුණාකර නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් පවත්වා ගෙන යනු ලබන වෙබ් අඩවියට පිවිසෙන්න. (www.nationstrust.com/personal/customer-proposition/private-banking)*

### 2.3 ජීවන රටාවටගැලපෙනප්‍රවේශ/පහසුකම්[10]

නේෂන්ස් ට්‍රස්ට් බැංකුවේPrivate Banking සේවයමඟින් ඔබට ජල ක්‍රීඩා, බෝට්ටු සවාරි, ප්‍රණීත ආහාර, විවිධවිනෝදාස්වාද සහ විශේෂ වැඩසටහන් වලින් සමන්විත 'මරීනා බොල්ගොඩ' (Marina Bolgoda) පෞද්ගලික විවේක මධ්‍යස්ථානයට සුවිශේෂී ප්‍රවේශයක් ලබා දේ.

නේෂන්ස් ට්‍රස්ට් බැංකුවේPrivate Banking සේවයේවටිනා සාමාජිකයෙකු ලෙස ඔබට පහත ප්‍රතිලාභ භුක්ති විඳීමේ හැකියාව ඇත:

සමාජිකත්වය

- මරීනා බොල්ගොඩ ප්‍රවේශ සමාජිකත්වය සඳහා සම්බන්ධ වීමේ විමේ ගාස්තුවලින් 50% ක වට්ටමක් .
- අපගේ ජල ක්‍රීඩා භාණ්ඩ සහකරුවන**ඩිබග්ඔටෝඑක්ස්ක්ලූසිව් (පුද්.) සමාගම/ඩිබග්හොස්පිටැලිටිසහලෙෂර්(පුද්.) සමාගමෙන්**තෝරාගත් ජෙට් ස්කී මාදිලි මිලදී ගන්නා නේෂන්ස් ට්‍රස්ට් බැංකුවේPrivate Banking සේවාදායකයින් සඳහා නොමිලේ සාමාජිකත්වය (සම්බන්ධ විමේගාස්තුවලින් 100% හා වාර්ෂික ගාස්තුවේපළමු වසරට100% වට්ටම්)

**එක්දිනප්රවේශ**

- නේෂන්ස් ට්‍රස්ට් බැංකුවේPrivate Banking සේවාදායකයින් සඳහාවසරකට**රුපියල් 12,000**ක්වටිනාප්‍රවේශපත්‍ර 2ක්නොමිලේ
- **ආහාරපානසඳහා 10% වට්ටමක්**
- **ජෙට්ස්කීසංචාරිසඳහා 10% වට්ටමක්**

**සුඛෝපභෝගී**බෝට්ටු/පුද්ගලිකජලයාත්‍රාසහඋපාංග

- නේෂන්ස් ට්‍රස්ට් බැංකුවේPrivate Banking සේවාදායකයින් **විසින්මිලදීගත්සියලුමමාදිලිවල**බෝට්ටුසහපුද්ගලිකජලයාත්‍රාසඳහා**වසරකවගකීම්සහතිකයක්**
- නේෂන්ස් ට්‍රස්ට් බැංකුවේPrivate Banking සේවාදායකයින් සඳහාපුද්ගලිකජලයාත්‍රාඋපාංගවලට(එන්ජිම, ඇදගෙන යාමේ යන්ත්‍ර හා ට්‍රේලර් යන්ත්‍ර) =සහඅලුත්වැඩියා සඳහා 10% වට්ටමක්

*[10]ජීවන රටාවටගැලපෙන ප්‍රවේශ/ පහසුකම් මඟින් ලබා දෙන ප්‍රතිලාභ කලින් කලට සමාලෝචනය කරන අතර ලබා දෙන නවතම පහසුකම් පිළිබඳ දැන ගැනීමට කරුණාකර නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් පවත්වා ගෙන යනු ලබන වෙබ් අඩවියට පිවිසෙන්න.(www.nationstrust.com/personal/customer-proposition/private-banking)*

### 2.4 පුද්ගල අවශ්‍යතා අනුව සකස් කළ වැඩසටහන් හා වෙළඳපළ අපේක්ෂාවන් පිළිබඳ සම්මන්ත්‍රණ[11]

පුද්ගල අවශ්‍යතා අනුව සකස් කළ ආයතනික, විනෝදාස්වාද සහ සම්භාෂණ සැමවිටම ඉහළ ප්‍රතිලාභ වලින් සමන්විත වේ. නේෂන්ස් ට්‍රස්ට් බැංකුවේPrivate Banking සාමාජිකයෙකු ලෙසවසර පුරාම, ප්රචලිතවන,විශේෂිත වැඩසටහන් සඳහා ආරාධනා ලැබීමටහිමිකම ඔබ සතුය. එවැනි ආරාධනා බැංකුවේඅභිමතය පරිදි සිදු කරන බව කරුණාවෙන් සලකන්න.

*[11]පුද්ගල අවශ්‍යතා අනුව සකස් කළ වැඩසටහන් හා වෙළඳපළ අපේක්ෂාවන් පිළිබඳ සම්මන්ත්‍රණ මගින් ලබා දෙන ප්‍රතිලාභ කලින් කලට සමාලෝචනය කරන අතර ලබා දෙන නවතම පහසුකම් පිළිබඳ දැන ගැනීමට කරුණාකර නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් පවත්වා ගෙන යනු ලබනවෙබ් අඩවියට පිවිසෙන්න.(www.nationstrust.com/personal/customer-proposition/private-banking)*

## 3. උරුමය

### 3.1.1 පරාර්ථකාමී කළමනාකරණ ගිණුම් සේවය

ධනයේ වටිනාකම ඉස්මතු වනුයේ එය, අවශ්‍යතාව ඇති අය සමග බෙදාගත් විටය. අපගේ පරාර්ථකාමී කළමනාකරණ ගිණුම් සේවය යටතේ ඔබේ ඉපැයීම්වලින් කිසියම් ප්‍රතිශතයක් පරාර්ථකාමීක්රියාවක් සඳහා ඉතිරි කිරීමට අවස්තාවසලසාඇත. තවද, අපගේ බැංකුවේ සමාජසුබසාධක/ආයතනිකසමාජවගකීම් (Cooperate Social Responsibility - CSR) විශේෂඥයින්ඔබ කැමති ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතියක් සංවිධානය කිරීමට ඔබට සහාය වීමට සූදානමින්සිටි.

*වැදගත්: ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති නේෂන්ස් ට්‍රස්ට් බැංකුවේ ආයතනික සමාජීය වගකීම් රාමුව /විෂය පථය හා ගැළපිය යුතු බැවින් ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම බැංකුවේ අභිමතය අනුව සිදුවනුඇත.*

### 3.1.2 කණිෂ්ඨ Private Banking සේවය

කණිෂ්ඨ Private Banking සේවය විශේෂයෙන්ම ඔබේ දරුවන් වෙනුවෙන් සකස් කළ වැඩසටහනකි. සේවා හා ප්‍රතිලාභ රාශියක් ලබා දෙන මෙම වැඩසටහන ඔබේ දරුවන්ව අර්ථික වශයෙන් ස්වාධීන වීමට මෙන්ම අනාගතයට මුහුණ දීම සඳහා අවශ්‍ය මෙවලම් වලින් සන්නද්ධ කිරීමට උපකාරී වන බව කිව යුතුය.

නේෂන්ස් ට්රස්ට් කණිෂ්ඨPrivate Bankingසේවයේ ප්‍රතිලාභ පහත දැක්වේ.

- කැපවූසබඳතාකළමණාකරුවෙකු (දෙමව්පියන්ටහාසමානව/දෙමව්පියන්ගේ කළමණාකරුම)
- දෙම්වපියන්ගේඅවසරයඇතිව, තැන්පතුකළමනාකරණයකිරීමටමූල්යඋපදේශනසේවාව
- IC සහ PB කණිෂ්ඨසාමාජිකයින්ටඔවුන්ගේසුවිශේෂීභාවයටසරිලනසාමාජිකකාඩ්පතක්
- කණිෂ්ඨසාමාජිකයින්සඳහාවිශේෂිතවසැකසූවැඩසටහන්සහඋත්සව (ආරාධිතයන්ටසීමාවූ)
- ඔවුන්ගේබැංකුසහමූල්යමයදැනුමවර්ධනයට, විවිධසම්පත්සහවැඩසටහන්/උත්සවවලටප්රවේශයන් (ආරාධිතයන්ටසීමාවූ)
- දෙමව්පියන් American Express ණයකාඩ්පතකින්භාණ්ඩ/සේවාසඳහාගෙවීමක්කරනවිටපිළිගැනීමක්ඇතිකාඩ්පත්හිමියන්සඳහාවට්ටම් (පවත්නාසැපයුමටයටත්ව)

### 3.1.3 අනාගත නායක වැඩසටහන

ඔබේ දරුවා වයස අවුරුදු 18 ත් 25 ත් අතර නම් ඔවුන්ට 'NTB අනාගත නායක වැඩසටහනට' ප්‍රවේශ වීමටකදිම අවස්ථාවක් හිමි වනු ඇත. සමවයස්කණ්ඩායම්සමගඔබේදරුවාසම්බන්ධකර, තීක්ෂ්ණබුද්ධියසහදැනුමවර්ධනයකිරීමටඅවස්තාවක්ලබාදීමතුළින්ඔබේදරුවාවඅනාගතයසඳහාසූදානම්කිරීමඅරමුණුකරගෙනමෙමවැඩසටහනසැලසුම්කරඇත.තවද, ඔබටසහඔබේවැඩිහිටිදරුවන්ටඋරුමයසැලසුම්කිරීමමෙන්මඅධ්යාපනය, පවුලහාධනයකළමනාකරණයයනමාතෘකාපිළිබඳපැවැත්වෙනවිශේෂසැසිසඳහාසහභාගීවීමටදඅවස්ථාවක්ඇත.

## 4. Private Banking සේවයේ ගෝලීය සමාජිකත්වය

ඔබරටින් බැහැරව සිටින විට ඔබගේ මූල්‍ය හා මූල්‍යනොවන කටයුතු කළමනාකරණය කිරීම තරමක් අභියෝගාත්මක විය හැකිය. මෙයට විසඳුමක් ලෙස නේෂන්ස් ට්රස්ට් Private Bankingසේවය ඔබ රටින් බැහැරව සිටින විට, ශ්‍රී ලංකාවේ ඔබ ගතකරන අද්විතීය ජීවන රටාවට ගැලපෙන ප්‍රතිලාභ සහ වරප්‍රසාද රාශියකින්

සමන්විත 'නේෂන්ස්ට්රස්ට් Private Bankingසේවයේ ගෝලීය සමාජිකත්ව වැඩසටහන' (PB Global) ඉදිරිපත් කර ඇත.

### 4.1 ගෝලීයසමාජිකත්වප්‍රතිලාභ

#### 4.1.1 ගෝලීයසෞඛ්‍යරක්ෂණසහාය

අපගේ වටිනා සේවාලාභීන් කුමන සෞඛ්‍ය තත්වයක සිටියද අවශ්‍ය ඕනෑම අවස්ථාවක ජාත්‍යන්තර මට්ටමේ සහාය සැපයීමේ අරමුණින් ගෝලීය සෞඛ්‍ය රක්ෂණ සහාය සේවාවනිර්මාණයකර ඇත. මෙම සේවයතුලින්අපගේ සේවාලාභියෙකුට පහත දැක්වෙන සුවිශේෂී ප්‍රතිලාභ ලබාගත හැක,[13]

- සිංගප්පූරුවේ මවුන්ට් එලිසබෙත් රෝහල, මවුන්ට් එලිසබෙත් නොවිනා රෝහල, ග්ලෙන්ඊගල් රෝහල හා පාර්ක්වේ ඊස්ටරෝහල් සඳහා සම්පූර්ණයෙන් ගෙවූ නේවාසික රෝහල් බිල්පත් (වෛද්‍ය ගාස්තු හැර) සඳහා 5% ක වට්ටමක්.
- තෝරාගත් විධායකශ්රේණියේසෞඛ්‍යපරීක්ෂණ(Executive Health Screening - EHS) පැකේජ සඳහා 10%ක වට්ටමක්.
- සාමාජිකයින් සඳහා Med Connect (පුද්) සමාගමේ පැය විසිහතර (24) පුරා ක්‍රියාත්මක ක්ෂණික ඇමතුම් සම්බන්ධතාව තුලින්, සිංගප්පූරුවේ මවුන්ට් එලිසබෙත් රෝහල, මවුන්ට් එලිසබෙත් නොවිනාරෝහල, ග්ලෙන්ඊගල් රෝහල හා පාර්ක්වේ ඊස්ටරෝහල්වලින් සෞඛ්‍ය සේවාලබාගතහැක.
- සිංගප්පූරුවේ චැන්ජිගුවන්තොටුපොළේසිට මවුන්ට් එලිසබෙත් රෝහල, මවුන්ට් එලිසබෙත් නොවිනා රෝහල, ග්ලෙන්ඊගල් රෝහල හා පාර්ක්වේ ඊස්ට රෝහල්වලට යාමට සහ ඒමට නොමිලේ ප්‍රවාහන පහසුකම්.
- බැංකු රාජකාරීවේලාවන් තුළ ලබා ගත හැකි වෛද්‍ය සේවාව යටතේ නේෂන්ස් ට්‍රස්ට් Private Bankingගනුදෙනුකරුවන් සඳහාම කැප වූ පාර්ක්වේ සමූහයේ (Parkway Group) ඉහළ නිපුණතාවයකින් සමන්විත විශේෂ වෛද්‍ය කණ්ඩායමක්සිටීම.

  අදාළ රෝහල්
  1. ග්ලෙන්ඊගල් රෝහල, 6A නැපියර් පාර, සිංගප්පූරුව 258500
  2. මවුන්ට් එලිසබෙත් රෝහල, 3 මවුන්ට් එලිසබෙත්, සිංගප්පූරුව 228510
  3. මවුන්ට් එලිසබෙත් නොවිනාරෝහල, 38 ඉරවඩ්ඩි පාර, සිංගප්පූරුව 329563
  4. පාර්ක්වේ ඊස්ටරෝහල, 321ජූ චියැට් පෙදෙස, සිංගප්පූරුව 427990

***මීට අමතරව PB Global සේවාලාභීන්ට ශ්‍රී ලංකාවේදී ද දේශීය වශයෙන් ප්‍රතිලාභ ලැබිය හැකි පරිපූර්ණ සේවා සමුදායක් සපයා ඇත[13].***

- කොළඹ 05 පිහිටාඇතිලංකා රෝහලේ (Lanka Hospital) සිදු කරන ලද තෝරාගත් වෛද්‍ය පරීක්ෂණ සඳහා 10% ක ඉතිරියක්.
- කැපවූ කාර්ය මණ්ඩල සාමාජිකයෙකුගේ ප්‍රමුඛත්ව සහය ඇතිව ලංකා රෝහලේ ප්‍රභූ විවේකාගාරයට ප්‍රවේශ වීමේ අවස්ථාව.
- කලින්කලටලංකා රෝහලේ වෙනත් විශේෂ වට්ටම් සහ සේවා සඳහා හිමිකම.

*[13]ප්රතිලාභ වරින් වර සංශෝධනය කෙරෙන අතර නවතම වරප්‍රසාද පිළිබඳ දැන ගැනීමට කරුණාකර නේෂන්ස් ට්‍රස්ට් බැංකුවේවෙබ් අඩවියට/ගාස්තුවක්රයට පිවිසෙන්න.(www.nationstrust.com/personal/customer-proposition/private-banking). PB Global සේවාලාභීන් AMEX හරහා ගෙවීම් කරන විට වට්ටම් ලබා ගත හැකි අතර අනෙකුත් ක්‍රම මගින් ගෙවීම් කිරීමේදී ප්‍රකාශිත කිසිඳු වට්ටමක් සඳහා සුදුසුකම් නොලබයි. වැදගත් : නේෂන්ස් ට්‍රස්ට් බැංකුව පී.එල්.සී විසින් උක්ත සේවය පිළිබඳ විශේෂිතතෙවන පාර්ශව සමාගමකට ඔබව හඳුන්වා දීම පමණක් සිදු කරන අතර එම සමාගම විසින් සපයනු ලබන උපදෙස් හෝ සේවාවන් සඳහා බැංකුව වගකීම දරන්නේ නැත.*

### 4.1.2 රියදුරෙකු ඇතිව හෝ නැතිව මෝටර් රථ කුලීසේවා සඳහා වට්ටම්

සංචාරයහාසම්බන්ධසැලසුම් හුදෙක් ගමනාන්තයක් කරා යන ක්‍රමවේදයකට වඩා වැඩි යමක් බව අපට වැටහේ. ශ්‍රී ලංකාවේ සංචාරය කරනකාලය තුළදී ඔබට විශිෂ්ට හා අමතක නොවන අත්දැකීමක් ලබා දීම අපගේ පළමුප්‍රමුඛතාව වේ. දිවයිනේ ඕනෑමස්ථානයකටගමන් කිරීමට, සංචාරයේ මුල සිට අග දක්වා කිසිඳු බාධාවකින් තොරව, එයඋපරිමයටඅත්දැකීමට ඔබට හැකිවන පරිදි, රියදුරු මහතෙකුගේ සහාය ඇතිව හෝ නැතිව, ඔබේ අවශ්‍යතාවයට ගැළපෙන පැකේජ අපගේ සේවාව මඟින් ලබා දේ. අපි අපගේ Private Banking ගෝලීය ගනුදෙනුකරුවන්ට වාහන කුලී ගාස්තු සඳහා වට්ටම් රාශියක් පහත සඳහන් පරිදි පිරිනමන්නෙමු[15],

**රියදුරු මහතෙකුගේ සහාය නොමැතිව**

- සති හා මාසික පදනමින් Hatch back මෝටර් රථවල තෝරාගත් මාදිලි සඳහා 20% ක වට්ටමක්
- සති හා මාසික පදනමින් SUV මෝටර් රථවල තෝරාගත් මාදිලි සඳහා 20% ක වට්ටමක්
- සති හා මාසික පදනමින් Sedan මෝටර් රථවල තෝරාගත් මාදිලි සඳහා 20% ක වට්ටමක්

**රියදුරු මහතෙකුගේ සහාය ඇතිව**

- දිවයින වටා යන සංචාර සඳහා තෝරාගත් SUVමෝටර් රථ හා වෑන් රථවලට 10% ක වට්ටමක්

*[15] ප්‍රතිලාභ වරින් වර සංශෝධනය කෙරෙන අතර නවතම වරප්‍රසාද පිළිබඳ දැන ගැනීමට කරුණාකර නේෂන්ස් ට්‍රස්ට් බැංකුවේවෙබ් අඩවියට/ගාස්තුවක්රයට පිවිසෙන්න. (www.nationstrust.com/personal/customer-proposition/private-banking). PB Global සේවාලාභීන් AMEX හරහා ගෙවීම් කරන විට වට්ටම් ලබා ගත හැකි අතර අනෙකුත් ක්‍රම මඟින් ගෙවීම් කිරීමේදී ප්‍රකාශිත කිසිඳු වට්ටමක් සඳහා සුදුසුකම් නොලබයි. වැදගත්: නේෂන්ස් ට්‍රස්ට් බැංකුව පී.එල්.සී විසින් උක්ත සේවය පිළිබඳ විශේෂිතතෙවන පාර්ශව සමාගමකට ඔබව හඳුන්වා දීම පමණක් සිදු කරන අතර එම සමාගම විසින් සපයනු ලබන උපදෙස් හෝ සේවාවන් සඳහා බැංකුව වගකීම දරන්නේ නැත.*

### 5. ප්‍රතිලාභ ලුහුඬින්

- ස්ථාවර තැන්පතු සඳහා විශේෂපොලී අනුපාත
- වෙළඳනාමයසහිත (branded)චෙක් පොත් නොමිලේ
- වසරකට චෙක් පොත් කවර දෙකක් නොමිලේ
- ගාස්තු රහිතව වෙනත් බැංකු ATM ගනුදෙනුකිරීමේහැකියාවසහ ඉහළදෛනික මුදලආපසුගැනීමේසීමා
- ගාස්තු රහිත ස්ථාවර නියෝග
- සහනදායී මිලටආරක්ෂිත සේප්පු පහසුකම්
- සියලු ගනුදෙනු එකම මූල්‍යප්‍රකාශයකින්
- ගාස්තු රහිතව බැංකුසේවා ඔබේ දොරකඩටම පැමිණීම
- ගාස්තු රහිත Private Banking හර කාඩ්පත් (නිකුත් කිරීමේ සහ වාර්ෂික ගාස්තු රහිතව)
- ශ්‍රී ලංකාව තුළ අනෙකුත් බැංකු ATM වලින්ගාස්තුරහිතවගනුදෙනුකිරීමේහැකියාව
- AMEX ප්‍රාථමික සහ අතිරේක ණය කාඩ්පත් සඳහා අලුතෙන් සම්බන්ධ වීමේ ගාස්තුවක් හෝ පළමුවාර්ෂික ගාස්තුවක් අය නොකෙරේ (Sri Lankan Airlines Platinum American Express Card සහ AMEX Explorer කාඩ්පත් හැර)
- නොමිලේ ගිණුම්ශේෂය තහවුරු කර ගැනීමේහැකියාව

### 6. සපුරාලිය යුතු සුදුසුකම්

ගිණුම් හිමිකරුට මෙම සුදුසුකම් වලින් එකක් හෝ තිබිය යුතුය:

ඕනෑම තැන්පතු ගිණුමක රුපියල් මිලියන10ක අවම මාසික සාමාන්‍ය ණය ශේෂයක් සමග ජංගම හෝ ඉතුරුම් ගිණුමක අවම වශයෙන් රුපියල් 10,000ක සාමාන්‍ය මාසික ශේෂයක් පවත්වා ගෙන යාම

හෝ

තැන්පතු සහ ණයතුලින් රුපියල් මිලියන 20ක සාමාන්‍ය ශේෂයක් සමග ජංගම හෝ ඉතුරුම් ගිණුමක අවම වශයෙන් රුපියල් 10,000 ක මාසික සාමාන්‍ය ශේෂයක් පවත්වා ගෙන යාම
හෝ
රුපියල්500,000 ක ශුද්ධ වැටුපක් නේෂන්ස් සැලරි සෙවර් ඉතුරුම් හෝ ජංගම ගිණුමකට මාසිකව ප්‍රේෂණය කිරීම (PB ගෝලීය සේවාදායකයින්ට/ශ්‍රීලංකාවේවාසයනොකරනඅය සඳහා අදාළ නොවේ)

**7. සබඳතා සමාලෝචනය**

**7.1 සබඳතාව පහළ හෙළීමේ නිර්ණායක**

Private Banking ගනුදෙනුකරු මාස 6ක් අඛණ්ඩව අවශ්‍ය අවම ශේෂය පවත්වාගෙනයාමට අපොහොසත් වුවහොත් සහ/හෝදින 120 කට වඩා වැඩි කාලයක් ක්‍රෙඩිට්කාඩ්, ණය සහ අයිරා, ආන්තික වෙළෙඳ සහ ලීසිං පහසුකම් ('ණය පහසුකම්') වලගෙවූ මිහිඟයක් පවත්වාගෙන ගියහොත්, බැංකුව ගනුදෙනුකරු සමග ඇති සම්බන්ධතාවය සමාලෝචනයකට ලක්කරති/ ශ්‍රේණිගතකිරීමෙන් පහළ හෙළනුලබති. ඒ අනුව, බැංකුව විසින් විශේෂ ප්‍රතිලාභ අත්හිටවනු ලබන අතර ගනුදෙනුකරුට දැනුම්දී ණය පහසුකම් සඳහා ලබාදී ඇති ඕනෑම විශේෂ වරප්‍රසාද /සහන,අවලංගු කරනු ඇත.

**7.2 ශේෂයඅවමවූවිටගෙවියයුතුගාස්තු**

Private Banking සේවා පාරිභෝගික සුදුසුකම් වල වෙනසක් හේතුවෙන් විශේෂ ප්‍රතිලාභ නතර කළහොත් සාමාන්‍ය ගාස්තු අදාළ වේ.
Private Banking ගනුදෙනුකරු, සුදුසුකම් අඛණ්ඩවමාසය තුළ පවත්වා ගෙන යාමට අපොහොසත් වන්නේ නම් රු. 2,500ක මාසික සේවා ගාස්තුවක් බැංකුව අය කරනු ඇත.

**8. කොන්දේසි**

8.1 මෙහි සඳහන් සුදුසුකම්/නිර්ණායක, අයකිරීමේ විශේෂ ක්‍රම, වරප්‍රසාද, ප්‍රතිලාභ, විශේෂාංග, ප්‍රදාන හා අනෙකුත් කොන්දේසි බැංකුවේ සාමාන්‍ය කොන්දේසි වලට යටත් වන අතර බැංකුව විසින් ලබා දෙනු ලබන විවිධ නිමැවුම් සහ සේවාවන් හැසිරීවීමට අදාළ සියලුම කොන්දේසි වලට ද යටත් වේ.

8.2 කිසියම් Private Banking ගනුදෙනුකරුවකු සුදුසුකම් අඛණ්ඩවනිසි පරිදි පවත්වා ගෙන යාමට අපොහොසත් වන්නේ නම් ඔහුට ලබා දී ඇතිවරප්‍රසාද ඉවත් කර ගැනීමට හෝ අවලංගු කිරීමට බැංකුවට අවස්ථාව ඇත.

8.3 ගනුදෙනුකරු සුදුසුකම් අවශ්‍ය මට්ටමින් පහත වැටෙන අවස්ථාවකදී තනි ගිණුම්වලට සමාන සේවා ගාස්තු අය කිරීමට බැංකුවට හිමිකම ඇත.

8.4 උක්ත නිර්ණායක, ගාස්තු, විශේෂ වැඩසටහන්, වරප්‍රසාද, නියමයන් සහ කොන්දේසි ඕනෑම අවස්ථාවක, තම අභිමතය පරිදි, පාරිභෝගිකයාට දැනුම් දීමකින් හෝ හේතු දැක්වීමකින් හෝ වගකීමක් තොරව අය කිරීමට, අවලංගු කිරීමට, ආපසු ගැනීමට සහ/හෝ අවලංගු කිරීමට බැංකුවට හිමිකමක් ඇත.

8.5 සාමාන්‍යගිණුම්පවත්වාගෙන යාම සඳහා බැංකුව විසින් නියම කරන ඕනෑම ලේඛනයකටගනුදෙනුකරු/වන් අත්සන් කල යුතුය.

8.6 බැංකුවට ඕනෑම අවස්ථාවක තම අභිමතය පරිදි එහි කොන්දේසි වෙනස් කිරීමට, වෙනස් කිරීමක් සහ/හෝ සංශෝධනය කිරීමට අයිතියක් ඇත. එවැනි ඕනෑම වෙනස් කිරීමක්, වෙනස් කිරීමක් සහ/හෝ සංශෝධනය කිරීමක් බැංකුව විසින් ලිපියකින් සහ/හෝ දේශීය පුවත්පතක දැන්වීමක් පළ කිරීමෙන් සහ/හෝ බැංකු ශාඛාවල දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කිරීමෙන් සහ/හෝ ප්‍රකාශන පණිවිඩ මඟින් ගනුදෙනුකරුට දැනුම් දීමට කටයුතු කරනු ඇත.එසේ ප්‍රචාරය කල දැනුම්දීම ගනුදෙනුකරුවන්ට නිසි පරිදි ලබාදුන්බවට සැලකිය හැක.

8.7 නීතියෙන්, රජයේ රෙගුලාසි හෝ උපදෙස් මත හෝ ශ්‍රී ලංකා මහ බැංකුවේ උපදෙස් අනුව බැංකු නියමයන් සහ කොන්දේසි සංශෝධන වන්නේ නම් බැංකුවේ නියමයන් සහ කොන්දේසි ද එයටයටත්ව සංශෝධනය වේ.

**9. බැංකුව හා සම්බන්ධ වීමට**

**9.1 Private Banking සේවයේසෘජුදුරකථනය සහමධ්‍යස්ථානය**
වැඩිවිස්තර, වෙනත්සේවාසහපොදුවිමසීම්සඳහාPrivate Banking සේවයේසෘජුදුරකථනඅංකයඅමතන්න
011 4711 400

Private Banking මධ්‍යස්ථානය
53, හෝටන් ප්ලේස්
කොළඹ 7

**9.2 මාර්ගගත ප්‍රවේශ**
වෙබ් අඩවිය: www.nationstrust.com
විද්‍යුත් තැපැල: info@nationstrust.com

*මෙහිසිංහලසහඉංග්‍රීසිපාඨඅතරයම්අනනුකූලතාවක්ඇතිවුවහොත්, එවිට, ඉංග්‍රීසිපාඨයබලපැවැත්වේ.*